		ලංජකාඅඳා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
මෙට්‍රොපොලිටන් ඉංජිනියරින් (පුද්) සමාගම		-				-	**406,304**
බී.එස්.ඉංජිනියරින්		6,650				6,650	**6,650**
අබාන්ස් (පුද්.) සමාගම		66,883				66,883	**66,883**
මැක්රෝ ඔටෝ ටෙක්		8,529				8,529	**8,529**
මෙගාහීටර්ස්		-				-	**53,395**
එන්.ජී.පී. ඉංජිනියරින්		892,815				892,815	**1,047,450**
ඒසර් මාර්කටින්		116,187				116,187	**116,187**
ඉලෙක්ට්‍රෝ සවර්		-				-	**965,976**
ඕරල් සමාගම		51,523				51,523	**51,523**
ඩී.පී.ජේ. හෝල්ඩින්ග්ස්		-				-	**110,296**
ඩිමෝ		38,611				38,611	**77,761**
ගංගොඩ එන්ට්‍රප්‍රයිසස්		-				-	**30,180**
ඒස් කැම් (පුද්ගලික) සමාගම		-				-	**90,835**
නෙට් ඉංජිනියරින්		-				-	**25,303**
ශ්‍රී විජය ඉන්ඩස්ට්‍රීස්		-				-	**18,161**
ජෝන් කීල්ස් කාර්යාලය		40,994				40,994	**316,344**
යුනිකෝන් මෙටලික්ස්		60,833				60,833	**60,833**
මාල්බෝ ට්‍රේඩින්		-				-	-
ඉලෙක්ට්‍රෝ ඔටෝමොටිව්ස්		-				-	**300,000**
නේම් බෝඩ්		-				-	**5,000**
රොක්වෙල් ඉන්ටර්නැෂනල්		32,120				32,120	**32,120**
සන්ඩ්‍රි ක්‍රෙඩිටර්ස්		142,463				142,463	**142,463**
ඇල්කොබ්‍රොන්ස්		-				-	**62,500**
ඉන්කො ඉංජිනියරින්		-				-	**77,874**
ටී.සී.අයි එන්ටප්‍රයිසස්		1,598				1,598	**1,598**
කස්ටම් ඉංජිනියස්		47,000				47,000	**47,000**
වී.එස් ඉන්ෆොමේෂන් සිස්ටම් (පුද්.) සමාගම		-				-	**809,850**
ශ්‍රී ලංකා ස්ටේටි ට්‍රෙඩින් (පෙන්) කොපරේෂන්		-				-	**3,197,581**
එස්.එස්.වී. කන්ස්ට්‍රක්ෂන්		-				-	**877,008**
සිංහගිරි (පුද්.) සමාගම		-				-	**433,462**
Service Creditors		1,240,812				1,240,812	**826,502**
ඇමත්‍යාංශ කාර්යාලය		-				-	**5,558**
සොලිනිටා ඉන්ටනැෂනල්(පුද්) සමාගම		936,200				936,200	**81,200**
මාර්ග සංවර්ධන අධිකාරිය		3,941				3,941	**29,808**
ටෙක්නොලොජිස් (පුද්) සමාගම						26,660	
ලිස්යෙක් හොල්ඩින් (පුද්) සමාගම		268,207				268,207	**268,207**
					26,660		
එකතුව		**3,955,375**	**-**	**-**	**26,660**	**3,982,035**	**10,650,341**

සටහන -28

ගෙවිය යුතු ගිණුම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඳා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ගෙවිය යුතු නිවාස ණය						-	-
ගෙවිය යුතු ප්‍රසම්පාදන මුද්දර				23,650		-	-
එකතුව		-	-	**23,650**	-	-	-

සටහන -29

තොග	සට:					රු. 2022	රු. 2021
		ලංජකාඅඳා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ලිපිද්‍රව්‍ය		31,727		955,227		986,954	**1,020,325**
තින්න		87,779				87,779	**144,082**
එකතුව		**119,506**	-	**955,227**	-	**1,074,733**	**1,164,408**

සටහන -30

ස්ථාවර වත්කම් සඳහා අත්තිකාරම්	සට:					රු. 2021	රු. 2020
		ලංජකාඅඳා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
ඉංජිනියරින් ටෙක්නොක්‍රසි (පුද්ගලික) සමාගම		273,324				273,324	**273,324**
		-				-	-
එකතුව		**273,324**	-	-	-	**273,324**	**273,324**

සටහන -31

වලනය නොවන තොග විකුණුම්	සට:					රු. 2022	රු. 2021
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
විකුණුම් වටිනාකම						-	-
පොත් වටිනාකම		-				-	-
						-	-
එකතුව		-	-	-	-	-	-

සටහන -32

පෙර වර්ෂ ගැලපුම්	සට:					රු. 2022	රු. 2021
		ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
දිරි දිමනා ගෙවීම් 2019 සහා 2020		-			-	-	(113,729)
2020 නොවැම්බර් මස පුවත්පත් වියදම		-				-	(1,590)
NVQ පූර්ව තක්සේරු ගාස්තු 2020		-				-	(1,500)
වැඩිපුර ගෙවූ විදුලි වියදම් නිවැරදි කිරීම		-				-	(2,581,537)
වැඩිපුර ගෙවූ විදුලි වියදම් නිවැරදි කිරීම		-				-	2,581,537
පෙර වසරේ වියදම් - විගණන ගාස්තු 2018		-				-	(559,200)
වැඩිපුර වෙන් කරන ලද විගණන ගාස්තු -2019		-				-	97,600
පෙර වසරේ වියදම් - විගණන ගාස්තු 2017							
පෙර වසරේ වියදම් -ගොඩනැගිලි ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (බොරැල්ල)							
පෙර වසරේ වියදම් -යන්ත්‍ර ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (බොරැල්ල)							
පෙර වසරේ වියදම් - ඌණ ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (ලංජකාඅඅා)							
පෙර වසරේ වියදම් - අධි ක්ෂය ගැලපීම් නිවැරදි කිරීම් (ලංජකාඅඅා)							
අතිකාල ගිණුම් නිවැරදි කිරීම් 2018 සහා 2019							
පෙර වසරේ වියදම් - ස්ථාවර තැම්පතු පොලි නිවැරදි කිරීම්							
පෙර වසරේ ආදායම් - ණය ගැනියන් ඔටෝමැටිව් ටෙක්							
ගොඩනැගිලි - ශ්‍රීලංජපුඅා			-			-	(49,576,860)
ලී බඩු සහ කාර්යාල උපකරණ			-			-	**(413)**
පුහුණු උපකරණ			-			-	**(6,199,499)**
පරිගණක සහ උපාංග			-			-	**(12,367)**
නේවාසිකාගාර කුලිය ගැලපීම			-			-	**441,296**
උත්සව අත්තිකාරම් නිවැරදි කිරීම්		(15,700)				(15,700)	-
පසුගිය වසර වලට අදාල වියදම්		1,164,760				1,164,760	
පසුගිය වසර වලට අදාල වියදම් (අර්ධ කාලීන)					(401,464)	(401,464)	
ස්.තැ. පොළී අධි වෙන් කිරීම් (අ.කා.)					(451,762)	(451,762)	
තොගය					8,532	8,532	
එකතුව		**1,149,060**	-	-	**(844,694)**	**304,367**	**(55,926,262)**

සටහන -33

පුහුණු හා හැකියා වර්ධන ව්යදම්- ප්‍රාග්ධන ව්යදම්	සට:	ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	රු. 2022 එකතුව	රු. 2021 එකතුව
පුහුණු හා සංවර්ධන-SSDP	38	-					
පුහුණු හා සංවර්ධන		731,420				731,420	**586,000**
පුහුණු හා සංවර්ධන ගිණුමට මාරු කිරීම්	19	(731,420)				(731,420)	(586,000)
එකතුව		-	-	-	-	-	-

සටහන -34

විවිධ ආදායම්-අර්ධකාලීන	සට:	ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	රු. 2022 එකතුව	රු. 2021 එකතුව
විභාග ගාස්තු		-			208,750	208,750	**92,500**
ෙක්සිබල් ලර්නින්					-	-	**334,975**
අෙනකුත් ආදායම්		-			94,825	94,825	**905,525**
						-	-
එකතුව		-	-	-	**303,575**	**303,575**	**1,333,000**

සටහන -35

ඩිප්ලෝමා පාඨමාලා දීමනා- NVQ	සට:	ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	රු. 2022 එකතුව	රු. 2021 එකතුව
පාඨමාලා ගාස්තු					3,446,000	3,446,000	-
ලියාපදිංචි ගාස්තු					-		
එකතුව		-	-	-	**3,446,000**	**3,446,000**	-

සටහන -36

ඩිප්ලෝමා පාඨමාලා ව්යදම්- NVQ	සට:	ලංජකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	රු. 2022 එකතුව	රු. 2021 එකතුව
බාහිර කථිකාචාර්ය දීමනා		-			-	-	**339,618**
අෙනකුත් ව්යදම්		-				-	-
Assessment Fees					996,426	996,426	**1,170,697**
එකතුව		-	-	-	**996,426**	**996,426**	**1,510,315**

සටහන -37

තාක්ෂණ විෂයය ඉගැන්වීම-පාසැල්	සට:					රු. 2022	රු. 2021
		ලංකාඅඅා	බොරැල්ල	ශ්‍රීලංජපුඅා	අර්ධකාලීන	එකතුව	එකතුව
නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය						-	-
ඉගැන්වීමේ දීමනා		-				-	-
අනෙකුත් පුනරාවර්තන වියදම්	23	-				-	-
						-	-
එකතුව		-	-		-	-	-

සටහන -38

නිපුණතා සංවර්ධන පුහුණු වැඩසටහන් (SSDP)		රු. 2022	රු. 2021			රු. 2022	රු. 2021
	සට:	එකතුව	එකතුව	ශ්‍රීලංජපුඅා	සට:	එකතුව	එකතුව
කාර්යය සාධන දීමනා	PL	-	13,611,651		23 E	-	13,612,050
තත්ත්ව කළමනාකරණ පද්ධතිය	PL	-	-			-	-
විෂයමාලා සංවර්ධනය	PL	-	1,133,681		23 A	-	1,133,581
සෙල් මෙම්බර් දීමනාව	PL	-	697,168		23 E	-	696,968
කොන්ත්‍රාත් උපදේශක දීමනාව	PL	-	-			-	-
සමාජ අලෙවිකරණය	PL	-	-			-	-
දිරි දීමනා ගෙවීම් - ශ්‍රීලංජපුඅා	PL	-	2,344,849		23E	-	2,344,849
එච්.ආර්.ඩි දීමනාව		-	-		23E	-	81,600
ප්‍රාග්ධන වියදම්		-	81,600			-	-
තැන්පතු මුදල ආපසු ගෙවීම්		-	-			-	-
එකතුව		-	17,868,949			-	17,869,049

සටහන -39

ජංගම ගිණුම	සට:					රු. 2022	රු. 2021
						එකතුව	එකතුව
අර්ධ කාලීන						-	(132,090,106)
අර්ධ කාලීන -ලංජකාඅඅා						-	132,090,106
ලංජකාඅඅා සමග ශ්‍රීලංජපුඅා ගිණුම						-	-
ශ්‍රීලංජපුඅා සමග ලංජකාඅඅා ගිණුම						-	-
ශ්‍රීලංජපුඅා සමග නයටා ගිණුම						-	-
එකතුව		-	-	-	-	(0)	(0)

සටහන -40

ලැබිය යුතු/ ගෙවිය යුතු	සට:					රු. 2021	රු. 2020
						එකතුව	එකතුව
ලැබිය යුතු MTTC දීමනා							
ගෙවිය යුතු MTTC දීමනා							
ලැබිය යුතු විදුලි වියදම්							
ගෙවිය යුතු විදුලි වියදම්							
එකතුව		-	-	-	-	-	-

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

	2022 (රු.)	2021 (රු.)
වත්කම්		
ජංගම වත්කම්		
බැංකු ශේෂය	2,649,842	3,209,777
ලැබිය යුතු වාරික ආදායම	178,191	152,075
ලැබිය යුතු පොලී	428,436	175,608
ස්ථාවර වත්කම්		
ආයෝජන		
ස්ථාවර තැන්පතු	10,052,841	9,684,331
මුළු වත්කම්	**13,309,310**	**13,221,791**
වගකීම්		
රක්ෂණ ගෙවීම්		
ශුද්ධ වත්කම්	13,309,310	13,221,791
සමුච්චිත අරමුදල	13,221,791	13,126,357
එකතුකලා- අතිරික්තය	87,519	95,434
මුළු වගකීම්	**13,309,310**	**13,221,791**

එස්.එම්.එස්.බී. ගුණසිංහ
අධ්‍යක්ෂ-විදුහල්පති (වැඩ බලන)
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ජේ.ඩී.වයි.බී.ජයසිංහ
ගණකාධිකාරී
ලං.ජ.කා.අ.ආ.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ආඛ්‍යනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

	2022 (රු.)	**2021 (රු.)**
ආදායම්		
වාරික ආදායම්	178,191	152,075
පොලී ආදායම්	871,927	532,550
එකතුව	**1,050,118**	**684,625**
වියදම්		
ආරක්ෂිත අයිතම	97,146	250,170
මුව ආවරණ	316,200	337,500
අධ්‍යාපන චාරිකා	549,683	
බැංකු ගාස්තු	-	1,521
සංග්‍රහ	890	-
එකතුව	**963,919**	**589,191**
අතිරික්තය	**86,199**	**95,434**
පෙර වර්ෂයේ ගැලපුම්	1,320	
අතිරික්තය	**87,519**	**95,434**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය
ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

විස්තරය	සටහන	2022 (රු.)	2021 (රු.)
මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
මෙහෙයුම් කටයුතුවලින් අතිරික්තය/ඌණතාවය		87,519	121,261
ඉකුත් වර්ෂයේ ගැලපීම්		(871,927)	(558,377)
		(784,408)	(437,116)
මුදල්මය නොවන ගනුදෙනු			
උපචිත වියදම් වැඩිවීම/අඩුවීම			
සමුච්චිත වියදම් වැඩිවීම/අඩුවීම			
ජංගම වගකීම් වැඩිවීම/අඩුවීම			
ජංගම වත්කම් වැඩිවීම/අඩුවීම		(26,116)	(132,116)
මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		(810,524)	(569,232)
ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම		-	-
		-	-
මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය			
ස්ථාවර තැම්පතු පොලි		619,099	558,377
ආයෝජන වැඩිවීම/අඩුවීම		(368,510)	(444,279)
		(559,935)	(455,134)
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ		3,209,777	3,664,911
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ		**2,649,842**	**3,209,777**

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ආධුනික පුද්ගල අනතුරු හා ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය

	සමුච්චිත අරමුදල (රු.)	මුළු වටිනාකම (රු.)
ආරම්භක ශේෂය 01.01.2022	13,221,791	13,221,791
පෙර වර්ෂයේ ගැලපුම්		
කාලපරිච්ඡේදය සඳහා ශුද්ධ අතිරික්තය	86,199	86,199
අඩුකිරීම් :	13,307,990	13,307,990
පෙර වසර ගැලපීම්	1,320	1,320
2022.12.31 දිනට ශේෂය	**13,309,310**	**13,309,310**

1.**පොදු තොරතුරු**

1.1 ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය 2017 අංක 15 දරණ පනතින් පිහිටුවන ලද කාර්මික පුහුණු ආයතනයකි.

1.2 ගිණුම් කාල සීමාව

2022 ජනවාරි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා වන මාස 12 ක කාල පරිච්ඡේදයකි.

2. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

2.1. **අනුකූලතා ප්‍රකාශය**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත වලට අනුකූල ලෙස ආයතනයේ ගිණුම් ප්‍රකාශන පිළියෙල කරන ලදි.

ගිණුම් ප්‍රකාශන වල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, අරමුදල් හා සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ඇතුලත්ය.

2.2. අඛණ්ඩ පැවැත්ම

ආයතනයට අඛණ්ඩ පැවැත්මක් ඇති බව සලකා ගිණුම් ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.3. මිණුම් කිරීමේ පදනම

අදාල සටහන් වලින් විශේෂයෙන් හෙලිදරව් කර නොමැති අවස්ථා වලදී මූල්‍ය ප්‍රකාශන උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර පිළියෙල කර ඇත.

ඉඩම් හා ගොඩනැගිලි 2013 වසරේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රත්‍යාගණනය කර ඇත. එලෙසම වාහන 2014 වසරේදී ප්‍රත්‍යාගණනය කරන ලදි. 2014 වසරේදී රු.1,899,262.00 ක වටිනාකමට පුස්තකාල පොත් තක්සේරු කර ගිණුම්වලට ගැනීමට කටයුතු කරන ලදි.

2.4. ක්ෂය කිරීම

මිලදීගත් මස සිට ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ. ආයතනයේ වාර්ෂික ක්ෂය කිරීමේ අනුපාතයන් පහතින් සඳහන් කර ඇත.

	වාර්ෂික අනුපාතය
ගොඩනැඟිලි	10%
මෝටර් රථ වාහන	25%
යන්ත්‍ර හා පුහුණු උපකරණ	12.5%
ලීබඩු උපකරණ	10%
කාර්යාල උපකරණ	25%
අනෙකුත් උපකරණ	25%
පුස්තකාල පොත්	25%

ජංගම වත්කම්

ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් හෝ ඊට අඩු කාලයක් පවතින වත්කම් ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. තොගය පෙර ලැබීම් පෙර නිකුතු ක්‍රමයට අගය කර ඇත.

2.5 විදේශ මුදල් ගණුදෙනු

විදේශ මුදලින් සිදු කරන ගණුදෙනු වලදී ගණුදෙනු සිදුවූ දිනට පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කර ගිණුම් ප්‍රකාශවල පෙන්වනු ඇත.

2.6 ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන ගණුදෙනු

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සියලු ප්‍රමාණාත්මක ගණුදෙනු ගිණුම් ප්‍රකාශන සඳහා අදාල කරගනු ලැබේ.

3. වගකීම් හා වෙන්කිරීම්

3.1 ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනාගත් සියලු වගකීම් ගිණුම්ගත කර ඇත. එලෙසම විය හැකි වගකීම් සඳහා ප්‍රමාණාත්මක වෙන් කිරීමක් සිදු කර ඇත.

3.2 විශ්‍රාම පාරිතෝෂික

ගිණුම් ප්‍රකාශන පිළියෙල කිරීමේදී 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත අනුව, විශ්‍රාම පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංගම පත්වීම් ලද සේවකයන් සඳහා සේවයකල වසරකට අමතර සති 02 ක පාරිතෝෂික වෙන් කරනු ලැබේ.

3.3. රජයේ ආධාර/ප්‍රදාන

භාණ්ඩාගාර ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන රජයේ ආධාර/ප්‍රදාන ලෙස ගිණුම්ගත කර ඇත. මෙම වටිනාකම වාර්ෂික ක්ෂය ප්‍රමාණය මත කපා හරිනු ලැබේ.

3.4 සේවක අර්ථ සාධක අයකිරීම්

සේවක අර්ථ සාධක අරමුදල සඳහා ආයතනයෙන් දායකත්වය 12% කි. සේවක දායක මුදල 08% කි. එලෙසම ශ්‍රීලංගම පත්වීම්ලාභී සේවක දායක මුදල 10% කි. සේවක අර්ථසාධක අරමුදල සඳහා SLGTI ආයතනයේ දායකත්වය 15% වන අතර සේවක දායකත්වය 10% කි.

4. සංචිත

සමුච්චිත අරමුදල් 2005 ට පෙර ශ්‍රී ලංගමයේ පාලන කාලය තුළ එහි සියලුම වත්කම්වල ණය ශේෂය නියෝජනය කරයි. ප්‍රාග්ධන සංචිත රුපියල් 4,407,578.00 යනු 2005 වර්ෂයේදී රජයෙන් වෙන් කර ඇති ප්‍රාග්ධන අරමුදල් වේ.

5. ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය (CGTTI) ප්‍රධාන කාර්යාලය සහ CGTTI – බොරැල්ල ශාඛාව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට (ශ්‍රී ලංගම) අයත් ඉඩම්වල පිහිටා ඇත. ලංගමයේ අයිතිය ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය වෙත පැවරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

6. සංසන්දනාත්මක අගයන්

2021 සහ 2022 වර්ෂයන්හි සංසන්දනාත්මක අගයන් ලං.ජ.කා.අ.ආ. සහ ශ්‍රී.ලං.ජ.පු.ආයතනයේ වෙන් වෙන් වශයෙන් සඳහන් කර තිබේ.

7. රේඛීය අමාත්‍යාංශයෙන් කාර්යය සාධන දීමනා ගෙවීම සඳහා ලද රු. 16,528,986.00 ක මුදල සටහන් අංක 15 යටතේ ඇතුලත් කර තිබේ.

8. අමතර කොටස් තොගවල ශුද්ධ උපලබ්ධි අගය (NRV) 2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා ඇත.

9. ලං.ජ.කා.අ.ආයතනය සහ ශ්‍රී.ලං.ජ.පු. ආයතනය සඳහා අදාල වන පුනරාවර්තන ප්‍රධාන 2022/12/31 දිනට අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන පත්‍රයේ වෙන් වශයෙන් සඳහන් කර තිබේ. ප්‍රාග්ධන ප්‍රධානයන් සටහන් අංක 13 හිද, මුළු ප්‍රාග්ධන ප්‍රධාන ලැබීම් සටහන් අංක 12 හිද ඉදිරිපත් කර තිබේ.

10. NAITA ආයතනයේ ජංගම ගිණුම් ශේෂය ලෙස කලින් සඳහන් කර තිබූ රු. 129,168,821.00 ක අගය 2020 වසරට පෙර ශ්‍රී.ලං.ජ.පු.ආයතනය සඳහා රජයෙන් ලද ප්‍රදාන වේ. මෙම අගය සටහන් අංක 13 යටතේ රජයෙන් ලද ප්‍රදාන ලෙස සටහන් කිරීමට කටයුතු කර තිබේ.

11. ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, යන්ත්‍රෝපකරණ හා පුහුණු උපකරණ ප්‍රත්‍යාගණනය කර 2022/12/31 දිනට ගිණුම් වලට ගෙන සටහන් අංක 02 යටතේ ඉදිරිපත් කර තිබේ. පරිත්‍යාග භාණ්ඩ ලැබීම් වෙනම සටහන් අංක 02 යටතේ සඳහන් කර ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } එස්වයිඒ/ඩී /සීජීටීඑ/1/22/30

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2023 මැයි29දින

සභාපති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34
+94 11 2 88 72 23
ag@auditorgeneral.gov.lk
www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම *ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු* ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2018 ජූලි 17 දිනැති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38 (1) (ඇ) ඡේදය	පනතේ විධි විධාන ප්‍රකාර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් ආයතනයේ වාර්ෂික වාර්තා හා වෙනත් මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වගබලා ගත යුතු වුවද, 2021 වර්ෂයේ වාර්ෂික වාර්තා 2023 අප්‍රේල් 25 දින වන විටත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	මුදල් රෙගුලාසි 880	රජයේ මුදල්, ආදායම්, මුද්දර හා බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටින හා පරිපාලනමය වශයෙන් වගකිව යුතු නිලධාරීන්ගේ ඇප තැන්පතු ඇප ආඥාපනතට අනුකූලව අයකරගෙන නොතිබුණි.
(ඇ)	මුදල් රෙගුලාසි 1646	ආයතනය විසින් පරිහරණය කරනු ලබන වාහන 25 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ආයෝජන ලෙස ස්ථාවර තැන්පතුවල රු.13,074,448 ක්ද, භාණ්ඩාගාර බිල්පත්වල රු.14,337,709 ක්ද, තැන්පත්කර තිබුණද, චක්‍රලේඛය ප්‍රකාර ඒ සඳහාද මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ඉ)	2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන 05/2008 චක්‍රලේඛය	මහජන අවශ්‍යතාවය කඩිනම්ව, ගුණාත්මකව හා අඛණ්ඩව ඉටුකරන බවට බැඳීමක් ඇති කිරීම සඳහා ආයතනය විසින් චක්‍රලේඛය ප්‍රකාර පුරවැසි ප්‍රඥප්තියක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඒ)	2017 අංක 15 දරන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ 04 හා 16 වන වගන්තිය	පනතේ විධිවිධාන ප්‍රකාර ආයතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සම්බන්ධ සියළු කාරණා පිළිබඳ පාලක මණ්ඩලයට සහ අදාල අමාත්‍යවරයාට නිර්දේශ ලබාදීම සඳහා උපදේශක සභාවක් පත්කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) 2019 දෙසැම්බර් 17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කිලිනොච්චියේ පිහිටා ඇති ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනය (SLGTI) හා යෝජිත මාතර ජාතික වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය එකම පරිපාලන අධිකාරියක් යටතට ගැනීම සඳහා ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ පනත සංශෝධනය කිරීමට අදාලව 2020 ජනවාරි 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. මේ අනුව ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) විසින් කිලිනොච්චියේ පවත්වාගෙන ගිය ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයට පවරා ගෙන තිබුණද පනත සංශෝධනය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ කාර්යයක් ලෙස වෘත්තීය පුහුණුව පිළිබඳ පර්යේෂණ කරගෙන යාම, කලාපීය මධ්‍යස්ථාන පිහිටුවීම හා වෘත්තීය සහ තාක්ෂණික පුහුණු කිරීම් පිළිබඳව සහරා සහ වාර ප්‍රකාශන පළ කිරීම දක්වා තිබුණද, එම කර්තව්‍යයන් සමාලෝචිත වර්ෂය දක්වා ඉටුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සේවය අත හැර ගිය සේවකයන් 03 දෙනෙකුගෙන් අයවිය යුතුරු.211,707 ක මුදලක් අයකර ගැනීමට කටුතු කර නොතිබුණි.

(ඈ) අර්ධකාලීන පාඨමාලා වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුමේ වර්ෂය පුරාරු.මිලියන 50 කට ආසන්න මුදලක් නිෂ්ක්‍රීයව පැවතිණි.

(ඉ) දිරිදීමනා ගෙවීමේදී ඒ සඳහා යෝජනා සකස් කර ආයතනය විසින් සපයන ලද සේවාවලින් ලද ආදායමෙන් ගෙවීමටත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කල යුතු බවට විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ ලබාදී තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතන පනතේ විධි විධාන ප්‍රකාරව ආයතනයෙහි සේවය කරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා වැටුප් වර්ධකද, පත්වීම් ලිපිද ලබාදී නොතිබූ අතර, සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් නොකල අවස්ථාවන්ද පැවතුණි.

(උ) අත්තිඩිය ශිෂ්‍ය නේවාසිකාගාරයට ගෘහ උපකරණ මිලදී ගැනීම හදිසි මිලදී ගැනීමක් ලෙස සලකා තරහකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අමාත්‍ය මණ්ඩලය අනුමත කල රු.මිලියන 50 ක සීමාව ඉක්මවා රු.64,967,611ක ප්‍රතිපාදන සලසා ප්‍රසම්පාදන දෙකක් යටතේ රු. 63,951,622 ක්වූ බදු සහිත පිරිවැයකට රාජ්‍ය ආයතනයකින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා 2021 දෙසැම්බර් 24 දින භාණ්ඩ ඇණවුම් කර තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 16 දින එනම් වසරක ප්‍රමාදයකින් පසු ආයතනය වෙත භාණ්ඩ ලැබී තිබුණි.

(ඌ) බොරැල්ල කලාපීය මධ්‍යස්ථානයට ත්‍රීරෝද කාර්මික පාඨමාලාව සඳහා අවශ්‍ය ත්‍රීරෝද රථ මිලදී ගැනීම් 2020 පෙබරවාරි මස සිදු කර තිබුණද, මේ දක්වා අභ්‍යාසලාභීන්ගේ පුහුණු අවශ්‍යතා ඉටුකර නොතිබුණි.

(එ) ආයතනය භුක්ති විඳිනු ලබන එකතුව අක්කර 29 ක් හා හෙක්ටයාර 0.35029 ක්වූ ඉඩම් 05 ක් ලංකා ගමනාගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ආයතනය විසින් මෙම ඉඩම් වල නීත්‍යානුකූල අයිතිකාරිත්වයක් හඳුනාගෙන පවරා ගැනීම් සිදුකර නොතිබුණි.

(ඒ) වර්ෂ 05 ක් තුල ආයතනයේ පූර්ණකාලීන පාඨමාලා සඳහා ඉල්ලුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව 3,075 සිට 4683 දක්වා වැඩි වී තිබුණද, ආයතනය සඳහා සිසුන් බඳවාගැනීම් සංඛ්‍යාව සිසුන් 600 සීමාව තුල පැවතුණි. මේ අනුව පාඨමාලාවන් සඳහා බඳවාගැනීමේ සීමාවට වඩා ඉල්ලුම් කරන සීමාව සියයට 412 සිට සියයට 681 ක වර්ධනයක් පැවතියද, ඉල්ලුමට සරිලන බඳවාගැනීම් සිදු කිරීම සඳහා ආයතනයේ ධාරිතාවය වැඩි දියුණු කර ගැනීමට අවධානය යොමුකර නොතිබුණි. ඒ සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි විය

i. ආණමඩුව හා කිලිනොච්චිය පුහුණු මධ්‍යස්ථානවල පිළිවෙළින් ඉඩම් අක්කර 09 ක් හා 25 ක් පැවතියද, මෙම මධ්‍යස්ථානවල පාඨමාලාවන් වර්ධනය කරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂයේදී බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ ත්‍රීරෝදරථ පාඨමාලාව සඳහා ආධුනිකයන් 37 දෙනෙකුද, ආණමඩුව කලාපිය පුහුණු මධ්‍යස්ථානයේ කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා පාඨමාලාව සඳහා ආධුනිකයන් 56 දෙනෙකුද බඳවාගෙන තිබුණි, 2020 වර්ෂයේ බොරැල්ල පුහුණු මධ්‍යස්ථානය සඳහා යෝජිත ඇලුමිනියම් ෆැබ්‍රිකේටර් පුහුණු පාඨමාලා අරම්භ කර නොතිබුණි.

iii. කිලිනොච්චි පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු පාඨමාලාවන් සඳහා ආධුනිකයින් 192 ක් බඳවාගෙන ඇතත්, 2021 වර්ෂයේ පාලක මණ්ඩල අනුමැතිය ලබාදුන් කෘෂිකාර්මික උපකරණ අළුත්වැඩියා කිරීමේ පාඨමාලාව ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව නව පාඨමාලා ආරම්භ කිරීමට හා ශිෂ්‍ය සහභාගීත්වය වැඩිකර ගැනීම සම්බන්ධයෙන් උපායමාර්ගික පියවර ගෙන කාර්යසාධනය වැඩිකර ගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

iv. සිසුන් ලියාපදිංචි වූ අවස්ථාවේ සිට පුහුණු කාලය අවසන්වී රැකියාගත කිරීමට අදාල තොරතුරු පද්ධතියක් ආයතනය සතුව නොපැවතුණි.

(ඔ) ආයතනය සතු අධ්‍යක්ෂ/ විදුහල්පති නිල නිවස 2020 වර්ෂයේ 2020 වර්ෂයේ සිට භාවිතයට ගෙන නොමැති වුවද, 2020 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා නිල නිවසේ ආරක්ෂක ගාස්තු ලෙස එකතුව රු.2,268,110 ක් වැයකර තිබුණි.

(ඕ) ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් 2018 වර්ෂයේ ආරම්භ කර 2020 ඔක්තෝබර් 25 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 06 කින් යුත් අත්තිඩිය ප්‍රදේශයේ පිහිටි නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

(ක) 2020 වර්ෂයේ ආරම්භ කර 2021 අගෝස්තු 31 දින වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ශිෂ්‍යයන් සඳහා ඉදිකරන ලද මහල් 03 කින් යුත් කිලිනොච්චියේ පිහිටා ඇති ශ්‍රී ලංකා ජර්මානු පුහුණු ආයතනයේ (SLGTI) නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් කර නොතිබුණි.

(ග) ආයතනයේ පුරප්පාඩු වී ඇති ප්‍රධාන තනතුරු පහට අදාළව අධ්‍යාපන සුදුසුකම් වලට සම වැටුප්තල සකස් කර ඒ පිළිබඳව භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර එම පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමට හා සේවක තනතුරු ප්‍රති ව්‍යුහගත කිරීමේදී වැටුප් වර්ධක සම්බන්ධයෙන් ඇති වූ ගැටලු සහගත තත්ත්වයන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට 2019 මැයි 23 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ ගිණුම් කාරක සභා රැස්වීමේදී ගෙන තිබූ තීරණයන් 2022 දෙසැම්බර් 31 දින තෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.තවද,2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම තනතුරු පුරප්පාඩුව පැවතුණි. එයට අමතරව, කිලිනොච්චිය ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දින වන විට අධ්‍යයන හා අනුධ්‍යාන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 61 ක් පැවතුණි.

(ච) ආයතනයේ අධ්‍යක්ෂ/විදුහල්පති තනතුර සඳහා 2020 පෙබරවාරි මස සිට පාලක සභා නියෝජිතයෙකු විෂය භාර ඇමතිතුමාගේ අනුමැතියකින් තොරව පත්කර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු.2,013,000 ක දීමනාවක් ගෙවා තිබුණි. කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක සිටි නිලධාරියෙකු නියෝජ්‍ය අධ්‍යක්ෂ/ නියෝජ්‍ය විදුහල්පති තනතුර සඳහා 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වැඩ ආවරණ පදනම්න් පත්කර වැටුප් හා හිඟ වැටුප් ලෙස රු.1,769,000 ක් ගෙවා තිබුණි.

(ඡ) කළමනාකරණ - මානව සම්පත් තනතුර දරන නිලධාරියෙකු ආයතනයේ ඇතිවූ ගැටළුකාරී තත්ත්වයක් මත පාලක මණ්ඩලයේ අනුමැතියෙන් කලාපීය මධ්‍යස්ථානයක පරිපාලන කටයුතු සඳහා යොදවා තිබුණ අතර නිලධාරියාගේ පිළිගත හැකි කාර්යසාධනයක් නොතිබුණද සමාලෝචිත වර්ෂයේ රු. 935,800 ක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

ඩබ්ලිව්. පී. සී. චිත්‍රමරත්න
විගණකාධිපති

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>
1.2 <u>මතය සඳහා පදනම</u>
1.3 <u>ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු</u>
1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.
1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

<u>නීතිරීති / විධානයට යොමුව</u>	<u>නිරීක්ෂණ</u>

(අ) 2021 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2023.08.22 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(ආ) මෙම කාර්යය දැනටමත් ආරම්භ කර අංක 2023/06/01 දිනැති පාලක මණ්ඩල පත්‍රිකාව මඟින් අනුමැතිය ලබාගෙන ඇත. එක් එක් නිලධාරියා විසින් තැබිය යුතු ඇප මුදල තීරණය කර වාචික වශයෙන් වැටුපෙන් අයකිරීමට කැමැත්ත ලබා දී ඇති නිලධාරීන්ගේ මාසික වැටුපෙන් වාරික අය කිරීමට පියවර ගෙන තිබේ.

(ඇ) විගණනය සඳහා ඉදිරිපත් කිරීමට සූදානම් කර ඇත.

(ඈ) අදාල ආයෝජන සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලුම් කළ ද පිළිතුරු ලැබී නැත. තවද, එම මුදල් පාලක මණ්ඩල අනුමැතිය සහිතව සංවර්ධන කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට පියවර ගෙන ඇති බව දන්වා සිටිමි.

(ඉ) කෙටුම්පත සාකච්ඡා කෙරෙමින් පවතින අතර කඩිනමින් එය අවසන් කිරීමට නියමිතය.

(ඊ) ඉදිරියේදී උපදේශන සභාවක් පත් කිරීමට නියමිතය.

2.2.4 භාණ්ඩාගාරය විසින් ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සීමා කිරීම නිසා සැලසුම් කළ පරිදි අවශ්‍ය උපකරණ ප්‍රසම්පාදනය කිරීමට නොහැකි විය. එලෙසම මෙම කාලසීමාවේ දී භාණ්ඩ මිල ගණන් සීඝ්‍රයෙන් ඉහළ යාම හේතුවෙන් ලංසුකරුවන් මිලගණන් ඉදිරිපත් නොකිරීම ද ප්‍රසම්පාදන කාර්යයන් අපේක්ෂිත අයුරින් ඉටුකරගත නොහැකි වීමට හේතුවිය.

2.3 වෙනත් කරුණු

(ආ) මේ සම්බන්ධයෙන් 2015 වර්ෂයේදී පර්යේෂණයක් සිදු කර ඇති අතර පවතින පාඨමාලා කාලය තුලට ඩිප්ලෝමා මට්ටම දක්වා උසස් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

තවද සහරා හා වාර ප්‍රකාශන පළ කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර ඉදිරියේදී මේ සම්බන්ධව කටයුතු කරනු ලැබේ.

(ඇ) පෙන්වා දී ඇති රු.211,707.00 ක මුදල තුළ නොදන්වා සේවය හැර ගිය T.M.C.දිසානායක මහතාගෙන් අයවිය යුතු රු.196,263.96 ක මුදල සහ පී.ඩී.සුමනසිරි මහතාගෙන් අය විය යුතු රු. 8444.40ක මුදල අය කරගැනීම සඳහා සිහිකැඳවීම් යවා ඇත. එමෙන්ම ජයන්ත ලියනගේ මහතාගෙන් අයකර ගැනීමට තිබූ රු.7049.83 ක මුදල2023.06.06 දින ගෙවා ඇත.

(ඈ) පාඨමාලා ගාස්තු එකවර අයකරන බැවින් පාඨමාලා ආරම්භයේ ජංගම ගිණුම් වැඩි ශේෂයක් ඇත. එම වටිනාකමින් ඉදිරි මාස 4 ක පමණ කාලයක් සඳහා කාර්ය මණ්ඩල දීමනා පුහුණු ද්‍රව්‍ය හා අදාල වෙනත් වියදම් දැරිය යුතු වේ. මසකට රු මිලියන 9 ක පමණ වන අර්ධ කාලීන දීමනා හා වෙනත් වියදම් දැරිය යුතු වේ. පාඨමාලා වාරයක් ආරම්භක කාලපරිච්ඡේදයේ විශාල මුදලක් මෙම ගිණුමට ලැබුණද, ඉන්පසු පාඨමාලාවට අදාළව ගෙවීම් කිරීමේදී ගිණුම් ශේෂය ක්‍රමයෙන් අඩුවන බව දන්වා සිටිමි.

(ඉ) නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම හා ඒ සඳහා දිරි දීමනා ගෙවීමට යොජනාවක් පිළියෙල කර පාලක මණ්ඩල පත්‍රිකා අංක 2023/04/02 යටතේ පාලක මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා ලෙස පාලක මණ්ඩලය උපදෙස් දී ඇත.ඒ අනුව භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය කටයුතු කිරීමට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

(ඊ) ශ්‍රී ලංගම සේවකයින්ට පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ 2017 අගෝස්තු මස 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් ලිපියක් ලබා දෙන ලෙස 2018.08.03 දින පැවති පාලන මණ්ඩල රැස්වීමේදි අනුමැතිය ලබා දී ඇත. කෙසේ වුවද පනතෙහි ප්‍රතිපාදන අනුව ,සේවයෙන් ඉවත් වීමට අවස්ථාවක් ලබා දී ඇති බැවින් ,පත්වීම් ලිපි නිකුත් කිරීම සම්බන්ධව සේවක පාර්ශවයන්හි විරෝධයක් පැවතුණු බැවින් පත්වීම් ලිපි ප්‍රදානය කිරීමට නොහැකි විය. මේ වන විට පත්වීම් ලිපි ප්‍රදානය කිරීම සඳහා කටයුතු සිදු කරමින් පවතී.

කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීමට කටයුතු කල ද ශ්‍රී ලංගම සේවකයින් ඊට විරෝධය පෑ හෙයින් එම විභාග පැවැත්වීමට නොහැකි විය. සේවකයින්ගේ දීර්ඝ සේවා කාලය ,වයස අවුරුදු 45 ඉක්මවා තිබීම වැනි කරුණු සලකා එම සේවකයින් කාර්යක්ෂමතා කඩඉම් විභාගවලින් නිදහස් කිරීමට පාලන මණ්ඩල අනුමැතිය පරිදි කටයුතු කර ඇත. එසේ නිදහස් නොකල සේවකයින් හට මේ වන විට කමිටුවක් පත් කර විභාග පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතී. කෙසේ වුවද පෙර ශ්‍රේණියේම වැටුප් වර්ධක ලබා දී ඇත. සේවක අර්ථ සාධක අරමුදල් අදාළ ගිණුම් වලට බැර කර ඇත.

(උ) 2021 වසරේදී අයවැය යෝජනා යටතේ අමාත්‍යාංශයට වෙන් කර තිබූ ප්‍රතිපාදන වලින් රු.64,967,611.00 ක ප්‍රතිපාදන නේවාසිකාගාරයේ ලී බඩු උපකරණ මිලදී ගැනීම සඳහා 2021/12/20 දින අමාත්‍යාංශය විසින් ලබා දී තිබේ.

සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවට තරඟකාරී මිල ක්‍රමයට බැහැරව එම ආයතනයෙන් පමණක් මිල ගණන් ඉදිරිපත් කර භාණ්ඩ සැපයීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබේ. ඒ අනුව මෙම මිලදී ගැනීම විගණන විමසුමේ පෙන්වා දී ඇති ආකාරයට හදිසි මිලදී ගැනීමක් සේ සලකා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිදු කල කාර්යයක් නොවනු ඇත. සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව රාජ්‍ය ආයතනයක් වන අතර අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව හදිසි අවස්ථා වලදී පමණක් නොව ඕනෑම අවස්ථාවකදී රාජ්‍ය ආයතන වලට ආයතන වලට අවශ්‍ය භාණ්ඩ උපකරණ සෘජු මිලදී ගැනීම් යටතේ එම ආයතනයෙන් පමණක් මිල ගණන් ලබාගෙන මිලදී ගැනීමේ හැකියාව පවතී.

අදාල උපකරණ ප්‍රසම්පාදන 02ක් යටතේ ලබා ගෙන තිබේ. පළමු ප්‍රසම්පාදනය ලෙස රු. 19,623,000.00 ක (බදු රහිත) වටිනාකමට භාණ්ඩ ඇණවුම්කර ලබා ගෙන ඇති අතර දෙවන ප්‍රසම්පාදන ලෙස රු. 39,591,465.00 (බදු රහිත) වටිනාකමට ඇණවුම් ඉදිරිපත් කර අවශ්‍ය භාණ්ඩ උපකරණ ලබා ගෙන තිබේ. ඒ අනුව ප්‍රසම්පාදන දෙකක් යටතේ සිදු කර ඇති මෙම මිලදී ගැනීම අනුමත සීමාව ඉක්මවා නොමැත. තවද ප්‍රසම්පාදන සීමාව සැලකීමේදී බදු රහිත වටිනාකම සැලකිය යුතුය.

2021 දෙසැම්බර් මාසයේ ඇණවුම් ඉදිරිපත් කර අදාල භාණ්ඩ සපයා ගැනීම නිසා ආයතනයට පාඩුවක් සිදුව නැත. 2022 වසරේදී භාණ්ඩ මිල ගණන් සීඝ්‍රයෙන් ඉහල ගිය අතර. මේ අනුව මෙම භාණ්ඩ 2022

වසරේදී ඇණවුම් කිරීමට කටයුතු කලේ නම් ඒ සඳහා වැය කල මුදලට සමාන මුදලක් වැඩිපුර ගෙවීමට සිදුවන බවත් එසේ වූයේ නම් මෙම භාණ්ඩ මිලදී ගැනීමට නොහැකි වන බවත් පෙන්වා දෙමි.

සිසුන් 700කට අධික ප්‍රමාණයකට නේවාසික පහසුකම් ලබා දීම සඳහා අවශ්‍ය උපකරණ මෙම මිලදී ගැනීමට ඇතුලත් විය. මහල් 6කින් යුත් මෙම ගොඩනැඟිල්ලේ අවසන් නිමවුම් කාර්යයන් මෙම කාලසීමාවේදී සිදු කෙරෙමින් පැවති අතර අදාල භාණ්ඩ උපකරණ සියල්ල එකවර ලබා ගෙන අසුරා තැබීමට ඉඩකඩ නොමැති විය. ඒ අනුව මෙම භාණ්ඩ හා උපකරණ අවස්ථා කිහිපයකදී ගෙනවිත් භාරදීමට සැපයුම් කරුවන්ට සිදුවිය.

(ඌ) දිවයිනෙහි පැවති විදේශ විනිමය හිඟය හේතුකොට ගෙන වාහන ආනයනය සීමා කර ඇති කාල පරිච්ඡේදයක ක්‍රියාත්මක කරන ලද මෙම ප්‍රසම්පාදනයේදී ප්‍රසම්පාදන අස්ථිත්වයේ පාලනයෙන් පරිභාහිරව සිදු වූ කරුණු මත අපේක්ෂිත ප්‍රතිඵල ළඟාකරගත නොහැකි විය. ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීමේ ක්‍රමයද ඇතුළුව දෙවරක් මිල ගණන් කැඳවුව ද, එක් ආයතනයක් පමණක් මිල ගණන් ඉදිරිපත් කිරීම, තෝරා ගත් ලංසුකරුට නොවැලැක්විය හැකි හේතු මත භාණ්ඩ සැපයීමට නොහැකි වීම, සපයන ලද භාණ්ඩ ලංසු ලේඛණයේ සහ ගිවිසුම් ගත කොන්දේසි වලට අනුකූල නොවීම යන කරුණු මත උක්ත ප්‍රසම්පාදනයෙන් අපේක්ෂිත අරමුණු ලඟාකරගත නොහැකි වී ඇති බව සඳහන් කරමි. ඒ අනුව අදාළ ප්‍රසම්පාදනය අවලංගු කරන ලදි.

(එ) මෙම ඉඩම් වල අයිතිය ලබා ගැනීම සඳහා අදාල ආයතන වෙත ලිපි යොමු කර ඇත.

(ඒ) i ආණමඩුව මධ්‍යස්ථානය පිහිටි සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 25 ක් ආයතනයේ අයිතියට පවතින අතර අක්කර 15ක ආයතනය පිහිටා ඇති අතර , අනෙක් අක්කර 10 ආයතනයට කිලෝමීටර් 1ක් දුරින් පිහිටා ඇත. එය ක්‍රීඩා පිටියක් ලෙස පවතී. ආණමඩුව මධ්‍යස්ථානයේ ඉදිරියේදී තවත් පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

ii ඇලුමිනියම් ෆැබ්රිකේට් පාඨමාලාව වෙනුවට මෝටර් රථ ක්ෂේත්‍රයට අදාළ පාඨමාලාවක් ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.

iii කිලිනොච්චිය හා මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සුදුසු කෘෂි යන්ත්‍රෝපකරණ ආයතනය වෙත පරිත්‍යාග කරන ලෙස ඉල්ලීමක් කල අතර මාස 03 කට පසුව එම පරිත්‍යාග ආයතනය වෙත ලැබුණි.

කෘෂි යන්ත්‍රෝපකරණ පාඨමාලාව සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන සම්පූර්ණ කර ඇති අතර එම පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් තෝරා ගන්නා ලදි. ඔවුන් දැනට මූලික මෝටර් කාර්මික අංශයේ පුහුණුව ලබන අතර ඉන් පසුව කෘෂි යන්ත්‍රෝපකරණ පාඨමාලාව ආරම්භ කිරීමට නියමිතය.

iv ආයතනයට සිසුන් ලියාපදිංචි කර ගැනීමේ අවස්ථාවේ සිට පුහුණුව අවසන් වීම දක්වා සිසුන්ගේ තොරතුරු ආයතනය තුළ පවත්වා ගෙන යනු ලබන අතර පුහුණු කාලය අවසන් වී රැකියා අවස්ථා සඳහා බාහිර ආයතන මඟින් සිසුන්ගේ තොරතුරු ඉල්ලා සිටින ආයතනවලට සිසුන්ගේ තොරතුරු ලබා දෙනු ලබන අතර රැකියා ලබා ගැනීමෙන් අනතුරුව එම ආයතන හා සිසුන් අප ආයතනය දැනුවත් නොකරන බැවින් රැකියාගත සියළුම අයවලුන් සම්බන්ධව දත්ත තබා ගැනීමට අපහසු වී ඇත. තොරතුර සපයන සිසුන් පිළිබඳව සියළු දත්ත ආයතනය සතු වේ.

(ඔ) 2020 වර්ෂයේ සිට මේ දක්වා ආයතනයට ස්ථිර වශයෙන් අධ්‍යක්ෂ/විදුහල්පතිවරයකු හෝ නියෝජ්‍ය විදුහල්පතිවරයෙකු නොසිටි අතර, අදාල තනතුරෙහි රාජකාරී සඳහා නිළධාරීන් කිහිප දෙනෙකු රේඛීය අමාත්‍යාංශය මඟින් පත්කිරීම සිදුවිය. ඒ හෙයින් අධ්‍යක්ෂ/විදුහල්පති නිළ නිවස භාවිතා කිරීමක් සිදුනොවීය. අධ්‍යක්ෂ/විදුහල්පති නිළ නිවස අදාල කාලපරිච්ඡේදයේදී ආයතනිය අධ්‍යක්ෂ/විදුහල්පතිවරුන් භාවිතා නොකල ද ආයතනය භාරයේ පවතින නාගරික ප්‍රදේශයක පිහිටා ඇති ගොඩනැඟිලි ඇතුළු වත්කම්වල ආරක්ෂාව තහවුරු කලයුතු බැවින් ඒ සඳහා ආරක්ෂකයින් යෙදවීමට සිදු විය. ඒ අනුව දරන ලද ආරක්ෂක වියදම ඵලදායී වියදමකි. දැනට සිදු කරන ප්‍රතිසංස්කරණ කටයුතු නිම කිරීමෙන් අනතුරුව වර්තමාන විදුහල්පති මෙම නිල නිවස භාවිතා කිරීමට නියමිතය

(ඕ) මෙම ආයතනයේ සිසුන් සඳහා ඉදිකරන ලද නේවාසිකාගාරයේ වැඩ මේ වන විට අවසන් කර ඇත.

(ක) නේවාසිකාගාර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන්ම නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන (SSDP) මඟින් සිදුවූවකි.

(ඟ) ආයතනය සඳහා විශේෂ වැටුප් ක්‍රමයක් යෝජනා කරමින් 2020.03.05 දාතමින් රේඛීය අමාත්‍යාංශ ලේකම් මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සභාපති ජාතික වැටුප් කොමිසමට ලිපියක් යොමු කල අතර, නැවතත් ඒ සම්බන්ධව තොරතුරු ඉදිරිපත් කරමින්, 2021.12.27 දාතමින් රේඛීය අමාත්‍යාශය මඟින් මුදල් අමාත්‍යාංශ ලේකම් වෙතට හා රේඛීය අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත.

නව වැටුප් ප්‍රතිපත්ති සකස් කිරීමේදී අධ්‍යයන කිරීමට හැකි වන පරිදි එම ගැටළු හා යෝජනා සම්බන්ධයෙන් සකස් කල වාර්තාව නැවතත් රේඛීය අමාත්‍යාංශයට 2022.01.18 දින යොමු කර ඇත.
එහෙත් මේ සම්බන්ධව ප්‍රතිචාරයක් ලැබී නොමැත.

රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික පුහුණු ආයතන වල අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවතින වැටුප් ගැටළු නිරාකරණය කිරීම සඳහා අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් පත් කරන ලද කමිටුව සහභාගී වී පවත්නා ගැටළු සම්බන්ධව සාකච්ඡා කර ඇත.

(ච) අධ්‍යක්ෂ-විදුහල්පති තනතුරට බඳවා ගැනීමට තිබූ අපහසුතා හේතුවෙන් 2020.02.18 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2017 අංක 15 දරන ලං.ජ.කා.අ.ආයතනීය පනතේ 17 (1) හා 17 (5) වගන්ති වලට අනුව අධ්‍යක්ෂ - විදුහල්පති ධුරයට ස්ථීර පත්වීමක් සිදු කරන තෙක් එහි කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාවරයා විසින් පත් කරන ලද පාලන මණ්ඩල සාමාජිකයකු වන උපාලි රණසිංහ මහතාව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක ADM/01/10/05/15 හා 2020.02.19 දිනැති ලිපිය මඟින් අධ්‍යක්ෂ - විදුහල්පති ධුරයේ කාර්යයන් ඉටු කිරීමට පත් කර ඇත. එම ලිපියෙහි දෙවන ඡේදයට අනුව ඔහුට මාසිකව රු. 61,000.00 ක දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත.

පාලන මණ්ඩලයේ අනුමැතිය පරිදි ඒ.එස්.ඒ .ගුණතිලක මහතාව 2011.07.01 දින සිට ප්‍රධාන ඉංජිනේරු - නිෂ්පාදන සේවා හා නඩත්තු තනතුරට පත් කර ඇත. 2015 දෙසැම්බර් මස සිට අන්තර්ග්‍රහණ යෝජනා අනුව සියළුම කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවා ඇති බැවින් මෙම නිලධාරියාගේ ඉල්ලීම සලකා බලා අනෙකුත් සේවකයින්ට අන්තර්ග්‍රහණය ක්‍රියාත්මක කර වැටුප් ගෙවූ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි උක්ත තනතුර සඳහා වැටුප් ගෙවා ඇත. රේඛීය අමාත්‍යාංශයේ ලේකම් මගින් මෙම නිලධාරී මහතා 2019.12.12 දින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ-නියෝජ්‍ය විදුහල්පති (ආවරණ) තනතුරට පත් කර ඇති නමුත් විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති පරිදි එම තනතුරට අදාල වැටුප් හා හිඟ වැටුප් අදාළ තනතුරේ රාජකාරී කල කාලයට අදාළව ගෙවා නොමැත.

(ඡ) මෙම ආයතනයේ කළමනාකාර-පරිපාලන හා මානව සම්පත් තනතුරෙහි කටයුතු කරන ලද නිලධාරි මහතාට එරෙහිව පැවති සේවක විරෝධතා හේතුවෙන් පාලන මණ්ඩලයේ උපදෙස් පරිදි ආයතනයේ කාර්මික සාමය පවත්වා ගැනීම සඳහා එම නිලධාරි මහතාට ආණමඩුව හා බොරැල්ල කලාපීය මධ්‍යස්ථාන වල අධීක්ෂණ කටයුතු ඔහුට පවරා තිබුණි. නැවත 2023.08.31 දින සිට මෙම නිලධාරි මහතා ප්‍රධාන කාර්යාලයට කැඳවා අදාල තනතුරෙහි රාජකාරියෙහි යොදවා ඇත.



අධ්‍යක්ෂ-විදුහල්පති
ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය